# ලංකාවිත්ති LANKA VITHTHI

මවත් මව්බිමත් ස්වර්ගයට වඩා උතුම්ය!
Mother and Motherland are nobler than Heaven



FOR FREE CIRCULATION
නොමිලේ බෙදාහැරීම පිණිසයි
VOLUME 11
NUMBER 09

ලොව කොතැනවුව වෙසෙන සිංහලයින් සඳහා ලන්ඩනයේ මුද්‍රිත සිංහල පුවත් පත
SINHALA LANGUAGE NEWSPAPER PUBLISHED IN LONDON FOR THE SINHALA READERS WHEREVER THEY ARE.

DECEMBER 10, 2008 දෙසැම්බර් මාසය (බුද්ධ වර්ෂ 2552 උඳුවප් මාසය)





**Madona & the Child ජේසු බිළිඳුන් සහ දේවමාතාව**

**By Italian painter Pompeo Girilamo Batoni (1708-1787)**
***ඉතාලියානු චිත්‍රශිල්පි - පොම්පියෝ ගිරිලාමෝ බටෝනිගේ පින්තාරුවකි***

වැනසෙන දිනෙක, දුක අඳුරම පිරි ලොවක
කළුවර නිවා සුදිලෙන පහනක් ලෙසක
දරුවෙකු කෙරෙහි දැල්වෙන සෙනෙහස මවක
මෙලෙසින් ලියමි බැතියෙන් සිව්පද කවක

**In a brittle, uncaring world, open to darkness**
**Like a gleaming lamp that brightens the earth**
**Towards her child, a mother's love binds**
**This, I respectfully wrap in these four lines**

♦ *දයා ආනන්ද රණසිංහ* ♦ *Daya Ananda Ransinghe*

**ලංකාවිත්ති වෙබ් අඩවිය Lanka Viththi Website**
**http://www. lankaheritage.com/lankaviththi/**

# ලංකාව - ඉන්දියාව හා ත්‍රස්තවාදය

♦ **සංජය විමලරත්න විසිනි**

**ජ**යග්‍රාහී ශ්‍රීලංකා හමුදා සේනාංක ක්‍රමවත්ව සීරුවෙන් ඉදිරියට යමින් තද වනාන්තරයෙන් සැදුම්ලත් මුලතිව් සහ කිලිනොච්චි දිස්ත්‍රික්ක දෙකෙහි කොටස් වලින් සමන්විත ජනගහනය ඉතා අඩු ත්‍රිකෝණාකාර කුඩා ප්‍රදේශයකට දැන් කොටි ත්‍රස්තවාදීන් කොටුකරගෙන ඇත. දැන් පවතින මහා මෝසම් වැස්සේ වුවත් මෙම ත්‍රිකෝණය දවසින් දවස කුඩාවෙයි. මින් ඉහත මේ ක්‍රියාන්විතය දෙස සැකයෙන් බැලූ ජාත්‍යන්තර නිරීක්ෂක කණ්ඩායම් පවා දැන් පවසන්නේ එල්ටීටීඊ ත්‍රස්තවාදීන්ගේ කිලිනොච්චි නින්දගමේ අවසානය අත ළඟ බව ය.

කොටින්ට අත්වන්නට යන අන්ත පරාජය වටහාගෙන බියට පත්ව සිටින, දැන් අන්ත මහළු වියේ පසුවන කරුණානිධි ප්‍රමුඛ තමිල්නාඩුවේ බංකොලොත් දේශපාලන කඩමාලු කල්ලියක් ක්‍රියාකාරී වෙමින් ඉන්දියන් අගමැතිවරයා හමුවන්නට ගොස් වහාම ශ්‍රීලංකාවේ සටන් නතර කරන්නට ලංකාණ්ඩුවට බලකරන්නැයි ඉල්ලා ඇත.

මෙහිදී කරුණානිධිලා අමූලික මහා බොරු තොගයක් ගොතා කියා ඇත. ඒ බොරු දැන් කොටිවත් ප්‍රචාරයට නොගන්නා වර්ගයේ බොරුය. එනම් සිවිල් වැසියන් 2,50,000ක් රජයේ හමුදා ක්‍රියා නිසා කොටුවී දුක් විඳින බවයි. ඒ මුළු දිස්ත්‍රික්ක දෙකේම ජනගහනය එකතු කළත් ඒ ගණනින් බාගය කටත් අඩු ය. ශ්‍රීලංකාවේ දෙමළ ජනගහනයෙන් බහුතරය නැගෙණහිර හා දකුණේ සිංහළ ප්‍රදේශවලත්, රජයෙන් මුදාගත් පෙදෙස් වලත් කරදරයෙන් තොරව ජීවත්වන බව කරුණානිධිලා නොදන්නවා නොවේ. උතුරේ යම් දෙමළ ජාතික කොටසක් කොටුවී සිටිනවා නම්, දුක්විඳිනවා නම් ඒ ඔවුන් මිනිස් පළිහක් ලෙස උන්ට ආවරණය වෙන්නට කොටි විසින් කොටුකරගෙන සිටින පිරිස මිස රජයේ හමුදා රඳවා තබාගත් අය නොවේ. කරුණානිධිලාගේ අනෙක් බොරුව නම් යුද හමුදාව දෙමළ ජනයා මරා දමන බවයි. හමුදාව එසේ කළේ නම් කොටි සංවිධානය ද, ඔවුන්ගේ ආධාරකාරයින් ද ඒ මැරුණු අයගේ පින්තූර වහා ලෝකයා හමුවට ගෙනැවිත් ඉමහත් කලබැගෑනියක් කරනවා නිසැකය. එහෙත් එසේ වූයේ නැත. කරුණානිධිලා මෙවැනි බොරු ගෙතීමෙන් උන්ගේ ජඩකම කොතෙක්දැයි මනාව ඔප්පු වේ.

තමිල්නාඩුවේ සිටින දේසපාලුවන්ට සැබැවින්ම ලංකාවේ දෙමළ සිවිල් වැසියන් ගැන කැක්කුමක් ඇත්නම් ලංකා හමුදාවට කියනවා වගේම යුද්ධය නවත්වන්නට කොටින්ට නොකියන්නේ ඇයි? එසේම ජාත්‍යන්තරව කොටින්ට ආධාර කරන්නට එපායයි උද්ඝෝෂණය නොකරන්නේ ඇයි?

කරුණානිධි, වයිකෝ සහ ජයලලිතා ඇතුළු මේ තමිල්නාඩු දේසපාලුවන් මේ පහත සඳහන් කරුණු ගැන නොදන්නා අය නොවේ.

එනම්, එල්ටීටීඊය ජාත්‍යන්තරව සහ ඉන්දියාවේ ද තහනම් ත්‍රස්තවාදී කල්ලියකි. මේ මෑතක කොළඹදී පැවති සාක් සමුළුවේදීද ඉන්දියාවද ඇතුළු රටවල් එකතුව අත්සන් තැබුවේ ගිනිකොණ දිග ආසියාවෙන් ත්‍රස්තවාදය තුරන්කරන්නට ඒ කවුරුත් කටයුතු කරන බවට ය.

ශ්‍රීලංකාව යනු ඉන්දියාවේ කැල්ලක් නොවේ. එය වෙනම නිදහස් ස්වෛරී රටකි. තම රට තුළ ක්‍රියාත්මක වන ත්‍රස්තවාදී කල්ලියක් රටෙන් වෙනම කැල්ලක් කඩාගන වෙනම රාජ්‍යයක් තනන්නට විනාශකාරී යුද්ධයක් අරඹා ඇත් නම් ඒ කල්ලිය නැති බංගකර දමන්නට අයිතියක් ශ්‍රීලංකාවට ඇති අතර ඊට ඇඟිළි ගැසීමට ඉන්දියාවට කොහෙත්ම අයිතියක් නැත.

කරුණානිධිට දැන් මතක නැතිවිය හැකි නමුත් 1963 දී ඔහු ම දකුණු ඉන්දියාවේ **ද්‍රවිඩස්ථාන්** යනුවෙන් දෙමළ සම්භවය ඇති අය සඳහාම පමණක් විශේෂ වූ රාජ්‍යක් හදන්නට විශාල අරගලයක් ගෙනගියා කාටත් මතක ඇත. මේ ක්‍රියාව නිසාම ඉන්දියානු රජය සිය ව්‍යවස්ථාවේ 16 වන සංශෝධනයක් ගෙනැවිත් සම්මත කරගත්තා ය. ඒ 16 වගන්තියට අනුව එවැනි බෙදුම්වාදී අදහස් ගෙනෙන කිසිදු දේශපාලන පක්ෂයකට දේශපාලනයට ඇතුල්වීම සපුරා තහනම් වන්නේ ය. ඉන්පසු කරුණානිධි නිහඬ විය. නමුත් දැන් ආපසු ඒ පැරණි සිතිවිල්ල ඔහුගේ ඔලුවට පැමිණ ඇත්තේ ඔහු දැන් ඉතා වයෝවෘද්ධව දෙවන ළමා කාලයට පිවිස ඇති නිසා ය.

## ඉන්දියාව සහ ත්‍රස්තවාදය

දශක කීපයක් තිස්සේ ඉන්දියාවට ත්‍රස්තවාදය ඉවසාසිටීම සහ එය පෝෂණය කිරීමේ පිළිවෙතක් සහිත ඉතිහාසයක් ඇත. දකුණු ඉන්දියාවේ දේශපාලනය මගින් ගෙනෙන ලද පීඩනය සහ බලකිරීම මත එවක ඉන්දීය අගමැතිනිය ඉන්දිරා ගාන්ධි 60 දශකයේ අවසානයේ කොටි සංවිධානය ඇතුළු වෙනත් ත්‍රස්තවාදී කල්ලි වලට ඉන්දියන් පොළවේ කඳවුරු හදාගන්නට දුන් බවත්, ඔවුන්ට ආයුධ පුහුණුව ලබාදුන් බවත් අප අමතක කළ යුතු නොවේ. මේ සියල්ලේ හේතුවෙන්ද අපේ කලින් බලයේ සිටි අමන ගොං දේශපාලකයින්ගේ ක්‍රියාවන් ද එක්වීමෙන් 80 ගණන්වල අපරටට අත්වූ හානිකර ප්‍රථිඵල ද අප අමතක නොකළ යුතුය.

අද අපේ ජනතාවද, දේශපාලකයන්ද, සන්නද්ධ හමුදාවන්ද ඒ පසුවූ සියළු අත්දැකීම් මත ඉතා ඉදිරියට පැමිණ ඇති අතර, එක්සිත්ව එක්සත්ව ස්වෛරී ජාතියක් ලෙස අපේ අයිතීන් රැකගැන්ම සඳහා පෙරමුණ ගෙන තවත් ඉදිරියට යමින් සිටිති.


**4 වන පිටුව බලන්න →**



